# සිංහල අවුරුදු චාරිත්‍ර 2025

## නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා මාර්තු මස 30 වැනි ඉරිදා දින ද අභිනව සූර්ය වර්ෂය සඳහා මැයි මස 01 වැනි බ්‍රහස්පතින්දා දින ද නව සඳ බැලීම මැනවි.

## පරණ අවුරුද්ද සඳහා ස්නානය

අප්‍රේල් මස 13 වැනි ඉරිදා දින දිවුල්පත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණයෙහි යෙදී වාසය මැනවි.

## අලුත් අවුරුදු උදාව

අප්‍රේල් මස 14 වැනි සඳුදා දින පූර්වභාග 03.21 ට සිංහල අලුත් අවුරුද්ද උදාවෙයි.

## පුණ්‍ය කාලය

අප්‍රේල් මස 13 වැනි ඉරිදා අපරභාග 08.57 සිට පසුදින එනම් 14 වැනි සඳුදා පූර්වභාග 09.45 දක්වා පුණ්‍ය කාලය බැවින් අප්‍රේල් මස 13 ඉරිදා අපරභාග 08.57 ට පළමුව ආහාර පාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත්වල යෙදෙනු මැනවි.

## ආහාර පිසීම

අප්‍රේල් මස 14 වැනි සඳුදා පූර්වභාග 04.04 ට තඹ වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ළිප් බැඳ ගිනි මොළවා කිරිබතක්ද කැවිලි වර්ගයක්ද දී කිරි සහ විලඳ ද පිළියෙල කර ගැනීම මැනවි.

# සිංහල අවුරුදු චාරිත්‍ර 2025

| | |
|---|---|
| වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය | අප්‍රේල් මස 14 වැනි සඳුදා පූර්වභාග 06.44 ට මුතු හා ශ්වේත වර්ණ වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා සියලු වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර අනුභව කිරීම මැනවි. |
| හිසතෙල් ගෑම | අප්‍රේල් මස 16 වැනි බදාදා පූර්වභාග 09.04 ට පච්ච හෙවත් කොල පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා හිසට කොහොඹ පත් ද පයට කොළොන්පත් ද තබා කොහොඹ පත් යුෂ මිශ්‍ර නානු හා තෙල් ගා ස්නානය කිරීම මැනවි. |
| රැකීරක්ෂා සඳහා පිටත්ව යෑම | අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා පූර්වභාග 09.03 ට රන්වන් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී කිරිබතක් හා එළකිරි මිශ්‍ර කැවිලි වර්ගයක් අනුභව කර උතුරු දිශාව බලා පිටත්ව යෑම මැනවි. |

Gazette.lk
SINCE 2014
AMBITIONS REALIZED

HTTPS://WWW.GAZETTE.LK/